ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන 2022/2023

6 වන මට්ටම - අවසාන පරීක්ෂණය

**EPU6332 - ප්‍රාථමික අධ්‍යාපනයේ සමකාලීන ගැටලු**

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2024.03.17 | වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පමණක් පිළිතුරු සපයන්න.

## 1 - වන කොටස

01. තුලනාත්මක අධ්‍යාපනය යන්න නිර්වචනයක් භාවිත කර පැහැදිලි කරන්න.

02. බහුවාර්ගික සමාජය යන්න ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

03. ජාතික සමගිය ඇති කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ පියවර ගෙන ඇත. එබඳු පියවර දෙකක් **(02)** සාකච්ඡා කරන්න.

04. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් හඳුනාගෙන ඇති පාසල් කළමනාකරණය පිළිබඳ ගැටලු තුනක් (03) ලියන්න. එම ගැටලු අතරින් **එකක් (01)** කෙටියෙන් පැහැදිලි කරන්න.

05. සංවර්ධනය වෙමින් පවතින රටවල ලක්ෂණ **හතරක් (04)** ලියන්න.

06. නීතිමය රාමුව මගින් එක්සත් රාජධානියේ (එංගලන්තයේ) ප්‍රාථමික පාසල් වර්ග තුනකට (03) බෙදා ඇත. එම පාසල් වර්ග **තුන (03)** නම් කරන්න.

07. එක්සත් රාජධානියේ (එංගලන්තයේ) ජාතික විෂයමාලාවේ වයස අවුරුදු 5 – 7 අතර (ප්‍රධාන අවධිය 1) දරුවන් සඳහා ක්‍රියාත්මක වන විෂයන් **පහක් (05)** නම් කරන්න.

08. ජපානයේ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(ලකුණු 5 **X** 8 = 40)

## 02 - කොටස

09. (i.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ගුණාත්මකභාවයේ වර්ධනය සඳහා තුලනාත්මක අධ්‍යාපනය භාවිත කළ හැකි ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) "අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල සාර්ථකභාවය රඳාපවතින්නේ පරදූතබන්නන් **(Stake Holders)** විසින් පුළුල් වශයෙන් පිළිගනු ලැබීම මතයි." මෙම අදහසට ඔබ එකඟ වන්නේ ද? කරුණු ඉදිරිපත් කරමින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු - 10)

10. (i.) සමාජවල පවතින බහුවිධ බව නිසා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මතුවන ගැටලු පහක් (05) කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු - 10)

(ii.) ප්‍රාථමික ශ්‍රේණි භාරව කටයුතු කරන ගුරුවරයකු ලෙස ඔබ බහුවිධ සමාජවලින් පැමිණෙන සිසුන් සමඟ සමානාත්මතාව ආරක්ෂා වන පරිදි කටයුතු කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු - 10)

11. (i.) "ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් පවතින ගැටලු අතර පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා ශිෂ්‍ය සාධන මට්ටම සම්බන්ධ ගැටලු ප්‍රධාන ලෙස ම හඳුනාගෙන ඇත." එලෙස හඳුනාගෙන ඇති ගැටලු පහක් (05) ඉතා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) ඉහත සඳහන් කළ ගැටලු අවම කිරීම සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු - 10)

12. (i.) ශ්‍රී ලංකාවේ හා ෆින්ලන්තයේ ප්‍රාථමික අධ්‍යාපනයේ නව ප්‍රවණතා පිළිබඳ ව සංසන්දනාත්මක විමර්ශනයක යෙදෙන්න. (ලකුණු - 05)

(ii.) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා වෙනත් රටවල ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලීන් තුළින් ගතහැකි ආදර්ශ උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු - 10)

13. (i.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය කෙරෙහි ගෝලීයකරණය බලපා ඇති ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) විවිධ සමාජයන් කෙරෙහි ගෝලීයකරණය නිසා ඇති වී ඇති යහපත් හා අයහපත් බලපෑම් තුන **(03)** බැගින් විශ්ලේෂණය කරන්න. (ලකුණු -10)

හිමිකම් ඇවිරිණි.